# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1873/23 - 2014 ජූලි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2014.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ප්‍රාලේබ/ඉ/1/2/119.
*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය :* 4-3/8/2012/පීසී/302.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 256සී තුඹගොඩ ග්‍රාම නිළධාරි වසමේ පල්ලෙවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 620086 කලාප 05න් 05 වැනි කලාපය පත්‍ර අංක 05ට අයත් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0983ක් වූ පහත උපලේඛනයේ සඳහන් ඉඩම.

#### උපලේඛනය

**කැබලි අංක 203**
ඉඩමේ නම: පිංමුල්ලෙකුඹුර, ගෙදරගාව අරාව, තැලිකාරගේ කුඹුර; හිමිකම් කියන අය: ආර්. එම්. රොද්‍රිගෝ, අංක 279, හලාවත පාර, දළුවකොටුව, කොච්චිකඩේ; ප්‍රමාණය: හෙක්. 0.0983.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2014 සැප්තැම්බර් මස 10 වැනි දින පෙ. ව. 10.00 ට බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2014 සැප්තැම්බර් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

වම්පික නිරෝෂ් ධර්මපාල,
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2014 ජූලි මස 30 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 572

---

සංශෝධනය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* කැප්‍රාලේ/අත්3/1/58/1-2.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1822/18 හා 2013.08.07 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බෝකුන්දර, තුම්බෝවිල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කො. 9260 හා 2013.12.18 දිනැති මූලික පිඹුරේ ලොට් අංක 87 හා 88 හි සංශෝධනයන් මෙසේ ය.

**01. කැබලි අංක 87**
ඉඩමේ නම: දෙල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එන්. නිමල් පෙරේරා, බෝකුන්දර, පිළියන්දල; ප්‍රමාණය: හෙක්. 0.0202.

**02. කැබලි අංක 88**
ඉඩමේ නම: දෙල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 3ක කොටස් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වික්ටර් පෙරේරා, බෝකුන්දර, පිළියන්දල; ප්‍රමාණය: හෙක්. 0.0111.

එල්. ඒ. කළුකපුආරච්චි,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරී,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2014 ජූලි මස 28 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 573/1

---

සංශෝධනය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : කැප්‍රාලේ/අත්3/1/58/1-2.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1822/18 හා 2013.08.07 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බෝකුන්දර, තුම්බෝවිල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කො. 9260 හා 2013.10.25 දිනැති මූලික පිඹුරේ ලොට් අංක 201 හා 202 හි සංශෝධනයන් මෙසේ ය.

**01. කැබලි අංක 201**
ඉඩමේ නම: වරිපනම් අංක 211 සහ 435, කොළඹ පාර දකුණ; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. ඒ. වීරසිංහ, අංක 211 සහ 435, කොළඹ පාර, තුම්බෝවිල, පිළියන්දල; ප්‍රමාණය: හෙක්. 0.0152.

**02. කැබලි අංක 202**
ඉඩමේ නම: සොයාගත නොහැක; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. ඩී. පී. චන්ද්‍රකුමාරි, තුම්බෝවිල, පිළියන්දල; ප්‍රමාණය: හෙක්. 0.0141.

එල්. ඒ. කළුකපුආරච්චි,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරී,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2014 ජූලි මස 28 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 573/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.